# සතර කෝරළයට අයත් ගල්බඩ කෝරළයේ ලෙව්කේ සේනාධිපති හෙවත් ලෙව්කේ මැතිඳු සම්බන්ධ ජනශ්‍රැති විමර්ශනයක්

**නන්දන මිල්ලගල[1] හා තිස්ස වීරසේකර[2]**

[1]බාහිර කථිකාචාර්ය, [2]ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය
dilhanimillagala@gmail.com

## හැඳින්වීම

ජනශ්‍රැති අධ්‍යයනය (Folklore studies) සන්නිවේදන ක්ෂේත්‍රයට සම්බන්ධවන විෂය කලාපයකි. මෙය සාම්ප්‍රදායික සන්නිවේදනය (Traditional communication) සමඟ ද සම්බන්ධ, එමෙන්ම සංස්කෘතික සන්නිවේදනය (Cultural communication) සමඟ ද සබැඳේ. ජනශ්‍රැතිය යනු ඓතිහාසික විද්‍යාව (Folklore is an Historical science) බව ඇලෙක්සැන්ඩර් හෙගාර්ටි කැරපේ විසින් පෙන්වා දෙයි. ජනශ්‍රැති අධ්‍යයනය මඟින් කරනුයේ ක්‍රම විද්‍යාවකට අනුව ඉතිහාසය ගවේෂණය කිරීමක් බව එම මතයෙන් ගම්‍ය වේ. ඉන්දියානු ජනශ්‍රැති පර්යේෂකයෙක් වූ මහරුප් ඉස්ලාම් (Magharul islam) දක්වන්නේ ජනශ්‍රැතිය ජන සංස්කෘතිය පිළිබිඹු කර පෙන්වන කැටපතක් බවත් එයින් ජන හද ගැහෙන රාවය මැනවින් තේරුම්ගත හැකි බවත් ය. ජනතාව ගේ සිතුම්, පැතුම්, චර්යා, වත් පිළිවෙත් විශ්වාසාදී ජන සංස්කෘතියේ අංග ජනශ්‍රැතිය තුළ පිළිබිඹු වන බව මින් ප්‍රකට වේ. මානව සමාජයේ ඓතිහාසිකව ජීවත් වූ මිනිසුන් හා ඔවුනගේ ජීවිත වටා පවත්නා විශේෂිත තොරතුරු ලේඛනගතව මෙන්ම ජනශ්‍රැති පරම්පරාවෙහි ද අන්තර්ගත වේ. එබඳු ඓතිහාසික පුද්ගල චරිතයක් ජනශ්‍රැතිය තුළ රෝපණය වන්නේ එකී පුද්ගලයා ජීවිත කාලයේදී ප්‍රකට කළ කැපී පෙනෙන සුවිශේෂතා හේතු කොටගෙනය. මෙම විමර්ශනයට විෂය වන, පුද්ගලයා වන ලෙව්කේ සේනාධිපති හෙවත් ලෙව්කේ මැතිඳු ලක් ඉතිහාසයේ මෑත භාගය නියෝජනය කළ සුවිශේෂ පුද්ගලයෙකි. පුරාවිද්‍යාව, ඉතිහාසය විෂය ක්ෂේත්‍රවල ඔහු පිළිබඳ පවත්නා අධ්‍යයන පවතී. එහෙත් ජනශ්‍රැති ක්ෂේත්‍රයේදී ජනප්‍රවාද ගතව පවත්නා සාධක අධ්‍යයනය ද වැදගත් වේ.

## අරමුණ

මෙම විමර්ශනය මගින් ජනශ්‍රැතිය තුළ ලෙව්කේ ප්‍රභුවරයාගේ චරිතය ගොඩ නැගී ඇති ආකාරය පිළිබඳ අධ්‍යයනය කෙරේ. එහිදී ජන කවිය, ජනප්‍රවාද, ජන කතාව ජන ඇදහිලි හා විශ්වාස, ජන ක්‍රීඩා , වැනි ජනශ්‍රැති අංගවල ලෙව්කේ මැතිඳුගේ චරිතය නිරූපණය වන ආකාරය විමර්ශනයට කේන්ද්‍ර වේ. එමෙන්ම එකී ජනශ්‍රැතිවල අන්තර්ගතය මගින් සන්නිවේදනය වන ලෙව්කේ චරිතයේ සුවිශේෂ ගුණාංග හඳුනා ගැනීමට ද උත්සුක වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

ක්ෂේත්‍ර ගවේෂණය, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ ක්‍රමය මෙන්ම ලිඛිත හා අලිඛිත මූලාශ්‍ර පරිශීලනයෙන් දත්ත ඒකරාශී කර ගැනීමට සිදු වේ.

## විමර්ශනය

ලෙව්කේ චරිතයෙන් නූතන පරපුරට ලද හැකි ආදර්ශ ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ ඉංග්‍රීසී පාලනය යටතට පත්වන විට කන්ද උඩරට සිංහල රාජධානීය වශයෙන් හඳුන්වන ලදී. සිංහල රාජධානීය ප්‍රධාන කොටස් විසි එකකින් ( 21 ) සමන්විත විය. මින් දොළහක් ( 12 ) දිසාවන්ය. ඒවා විශාල පාලන ඒකකය. ඉතිරි කොටස් නවය ( 9 ) රට නමින් හඳුන්වන ලද කුඩා පාලන ඒකකයන්ය. ඒ

අනුව සතර කෝරලය ප්‍රධාන දිසාවකි. මෙයට ගල්බඩ කෝරලේ පරණ කුරු කෝරලේ , කිඳිගොඩ කෝරලේ ,බෙලිගල් කෝරලේ , යන කෝරල සතර අයත් නිසා සතර කෝරලේ නමින් හඳුන්වන ලදී. ජෝන් ඩොයිලිගේ සිංහලේ ආණ්ඩුක්‍රමය නම් කෘතියේ මෙම බෙදීම් සවිස්තරව ඇත. වර්තමාන කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් අංක දහඅට (18) යටතේ ලෙව්කේ ග්‍රාමය පිහිටා ඇත¨ එය පැරණි ක්‍රමයට අනුව ගල්බඩ කෝරලේට අයත් වේ. මෙම විමර්ශනයට සම්බන්ධ කේන්ද්‍රීය චරිතය වන ලෙව්කේ සෙන්පතිගේ ජාත භූමිය හා ඔහුගේ ජීවිතය හා සබැඳුණු ජනශ්‍රැති ව්‍යවහාර පවත්නා කලාපය වන්නේ ද ලෙව්කේ නින්ද ගමයි. ලක් ඉතිහාසයට සම්බන්ධවන වලව් තිහක් (30) ගැන කියැවෙන ජන කවි අතර ලෙව්කේ වලව්ව ගැන සඳහන් වේ.

ලෙව්කේ ඒ දඬුවාව , මොල්ලිගොඩ දොඩන්තලේ සහ කෙම්පිටියත්

මාකඩවර, වැලි මත්තේ , මාදන , කුඹල් ඔළුව සහ මාදෙණියත්

ආදී වශයෙනි.

එච්. සී. පී. බෙල් මහතා විසින් සකසන ලද **Report on the Kegalle District of the Province on Sabaragamwa** - (කෑගල්ල දිස්ත්‍රික්කය පිළිබඳ බෙල් වාර්තාව) දක්වන පරිදි ද දිස්ත්‍රික්කයේ පැරණිගම වලව්ව ලෙව්කේ වලව්වයි.

අපගේ විමසුමට ලක්වන ලෙව්කේ ප්‍රභුවරයා මැතිඳු , රාල , රටේ රාල ,උප අධිකාරම , රාළහාමි , කෝරාල, සේනාධිපති, දිසාව ආදී විවිධ තනතුරුනාමයන්ගෙන් විශේෂණය වේ. එය ලෙව්කේ නාමයෙන් පුද්ගලයන් කීපදෙනෙක් සිටි බවට වඩා ඔහු රාජ්‍ය සේවයේ විවිධ තනතුරු හොබවමින් ස්වකීය නාමය ගෞරවණීයත්වයට පත් කරගෙන ඇති බවයි.

*"දෙවිරද උපුල්වන් පෙර ලක්දිව පැමිණි*

*නැව් කප්පරින් ගොඩබට පරපුරෙන් දනී*

*සිව් කෝරලේ කරවන නරවර ලෙසිනී*

*ලෙව්කේ මැතිඳු රජ සබයට ද දක්වැනී"*

මොහුගේ අසහාය කාය බලය ද , ප්‍රඥාමහිමය ද සටන් කාමීත්වය ද , ක්‍රිඩා ශීලිත්වය ද , සංවිධාන ශක්තිය ද පරිපාලන ඥාණය ද , ක්‍රීඩාශීලිත්වය ද ,සංවිධාන ශක්තිය ද පරිපාලන ඥාණය ද ඇතුළුගුණාංග රාශිභූත මෑත ඉතිහාසයේ යෝධයා ඔහු ය. ත්‍රි සිංහලේ සේනාධිපති සතර කෝරලේ දිසාපති ලෙව්කේ විජය සුන්දර රාජකරුණා සෙනවිරත්න හේරත් මුදියන්සේ යන ගෞරවනාම පෙළක් ඔහු වෙත එක් වන්නේ එබැවිනි ලෙව්කේ චරිතය වටා ඇති ජනශ්‍රැති අංග උතර ජන කවිය විශේෂිත වේ.

උත්පත්තියේ මරණය දක්වා ඔහුගේ චරිතය කැපී පෙනෙන අවස්ථා පිළිබඳ ප්‍රකට මෙන්ම අප්‍රකට ජනකවි පවතී. ලෙව්කේ අයුක්ති සහගත ලෙස මරා දමූ විට ජනකවියා එය මෙසේ දක්වයි.

*"පුන්සඳ සේම පායාලා රට*
*මැද්දේ*

*රත් කෙඳිසේම පීරාලා රට*
*මැද්දේ*

*මාර සෙනඟ වට කරගෙන යම*
*යුද්දේ*

*ලෙව්කේ මැතිඳු අද තනියම වෙල*
*මැද්දේ "*

යනුවෙනි.

- ජනප්‍රවාද ගත කතාවල ඔහුගේ විශ්මිත කායික බලය , ක්‍රීඩා කෞශල්‍ය ගැන සඳහන් වේ. මල්ලව පොර හා අංගම්පොර ශූරයෙක් ලෙස , දෙස් විදෙස් සියලු ශක්තිවන්තයන් අබිබවා යාමට තරම් ඔහු සමත් වූ බවට කතා ගණනාවක් පවතී.
- රාජ්‍ය සේවයට එක්වන්නේ මල්ලවපොර ශූරයෙක් ලෙස වූවත් පාලී භාෂාඥානය හා බෞද්ධ ධර්මඥානය නිසා තමා වෙත ලද සියලූම රාජ්‍ය තනතුරු බුදුදහම නගා සිටුවීමටත් , බෞද්ධ සංස්කෘතියේ කේන්ද්‍රස්ථානය වූ වෙහෙර විහාර ප්‍රතිසංස්කරනය කිරීමටත් , ඉංග්‍රීසි අධිරාජ්‍යවාදයට එරෙහිව සංවිධානාත්මකව හා උපායශීලීව නැගී සිටීමටත් යොදාගත්බව ප්‍රකට වේ. එතුමන් , ශ්‍රී සංඝරාජ හිමියන් කුඩාකල උන්වහන්සේට පාලී භාෂාව ඉගැන් වූ බව ද දක්වේ. නරේන්ද්‍රසිංහ , ශ්‍රී විජය රාජසිංහ යන රජුන් ඇසුරේ අවිචාරවත් රාජ්‍ය සේවකයෙක් ලෙස නොව සිය කාය , වාග් , ප්‍රඥා බල මහිමය විචාරශීලීව යොදා

ගෙන රජුන් ද අනෙකුත් ප්‍රභූන් ද , ලංකාවේ නිදහස වෙනුවෙන් යොදා ගැනීමට උත්සුක වූ බව විශේෂිත වේ ලක් ඉතිහාසයේ හමුවන ප්‍රකට යෝධයින් , විරුවන් ප්‍රභූන් අතර ලෙව්කේ වඩාත්ම නූතන පරපුරට පරමාදර්ශී චරිතයක් ලෙස මතු කළ හැකි බව ඔහු පිළිබඳ පවත්නා ජනශ්‍රැති නිරීක්ෂණය කරන විට පැහැදිලි වේ.

යෝධයන් හා විරුවන් පිළිබඳ සුලබ ලක් ඉතිහාසයේ මෑත භාගයෙන් හමුවන , හුදෙක් කාය බලයෙන් පමණක් නොව , ප්‍රඥාබවත් සංවිධාන ශක්තියෙන් , පරිපාලන ඥාණයෙන් සමන්විත සැබෑ යෝධයා ලෙව්කේ දිසාව බව ජනශ්‍රැති මගින් ප්‍රකට වේ. එතුමාගේ අනුග්‍රහයෙන් ප්‍රතිසංස්කරණය කළ සෑම විහාරස්ථානයකම ලෙව්කේ සිතුවම ඇඳීමෙන් එතුමාට තිබූ ජනප්‍රසාදය ද විද්‍යාමාන වේ. ලෙව්කේ චරිතය වටා පවත්නා ජනප්‍රවාද ගත කතා , ජනකවි, ජනක්‍රීඩා , විශ්වාස හා ඇදහිලි විමර්ශනය කිරීමේදී මෙම චරිතය තවදුරටත් ඉතිහාසයේ මැකීයා නොදිය යුතු චරිතයකි. වැඩවසම් රදළ ප්‍රභූවරයෙක් ලෙස අවමානයෙන් යටපත් නොකළ යුත්තෙකි. ඔහු නූතන පරපුර වෙත ලාංකීය අභිමානය ගෙන එන විරු චරිතයක් ලෙස මතුකළ යුතු චරිතයක් බව පැහැදිලි වේ.

## ආශ්‍රය ග්‍රන්ථ


කෑගලු ජනකවි 2001, කෑගලු කවිසමාජය.

මහාවංශය ( සිංහල) 2004, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය , නැදිමාල, දෙහිවල.

ලැනරෝල් ඩී.වී. ද , 1960 , ලංකා පුරා වෘත්ත එම්. ඩී. ගුණසේන සමාගම , කොළඹ.

අතුකෝරල , කේ. 1996 , සතර කෝරලේ , ඇස් ගොඩගේ සහෝදරයෝ - කොළඹ 10.